## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීම - 2026

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ උපලේඛනගත තනතුරුවල පවත්නා පුරප්පාඩු 13 ක් පිරවීම සඳහා අංක 1840/51 හා 2013.12.13 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ සක්‍රීය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව මෙම තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන් පත්කිරීමට අදාළව මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පතට අනුව අයදුම්පත් කැඳවනු ලබන අතර, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට අදාළ සියළු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. එම අයදුම්පත් හා අදාළ ලිපි ලේඛන ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන **2026.08.25** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කිරීමට හෝ අතින් ගෙනවිත් භාරදීමට හෝ කටයුතු කළ යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " **ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීම - 2026** " යනුවෙන් සඳහන් කළ යුතුය.

ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
(පශු සම්පත් අංශය - බිම්මහල)
නො.80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග
බත්තරමුල්ල.

03. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව හා ඒවා පවතින ආයතන පිළිබඳ විස්තර පහත දැක්වේ.

- කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
  - ❖ අධ්‍යක්ෂ (පශු සම්පත් සංවර්ධන) - තනතුරු 01
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
  - ❖ අධ්‍යක්ෂ ( වනජීවී සෞඛ්‍ය) - තනතුරු 01
- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
  - ❖ අධ්‍යක්ෂ (පශු පර්යේෂණ) - තනතුරු 01
  - ❖ ලේඛකාධිකාරී (පශු ඖෂධ) - තනතුරු 01
  - ❖ ප්‍රධාන වසංගතවේදී - තනතුරු 01
  - ❖ ප්‍රධාන ශල්‍යවේදී - තනතුරු 01
  - ❖ ප්‍රධාන විද්‍යාඥ - තනතුරු 02
  - ❖ ප්‍රධාන පශු ආර්ථික විශේෂඥ - තනතුරු 01
  - ❖ පශු ව්‍යාප්ති විශේෂඥ - තනතුරු 01
  - ❖ සත්ත්ව අභිජනන විශේෂඥ - තනතුරු 01
  - ❖ පශු මහජන සෞඛ්‍ය විශේෂඥ - තනතුරු 01
  - ❖ ක්ෂීර ඉංජිනේරු විශේෂඥ - තනතුරු 01

04. සපුරාලිය යුතු පොදු සුදුසුකම්

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ වසර තුනක (03) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සක්‍රීය සේවයේ නියුතු නිලධාරියෙකු වීම.

05. ලැබෙන අයදුම්පත් අනුව සුදුසුකම් සපුරා ඇති සක්‍රිය සේවයේ සිටින අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට එහි ප්‍රතිඵල අනුව වැඩිම ලකුණු ලබාගන්නා නිලධාරීන්ගේ මනාපය අනුව අදාළ තනතුරුවලට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ. අදාළ නිලධාරියා එම තනතුර භාර නොගන්නේ නම් ඊළඟට වැඩිම ලකුණු ලබාගත් නිලධාරියාගේ මනාපය අනුව එම තනතුරට පත්කරනු ලැබේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන විෂය ක්ෂේත්‍රයන් හා උපරිම ලකුණු ප්‍රමාණය පහත පරිදි වේ.

| අනු අංකය | ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රයන් | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | ජ්‍යෙෂ්ඨතාවය (උපරිම ලකුණු 40) | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I වන ශ්‍රේණියේ වසර 03 ක සක්‍රිය හා සතුටුදායක සේවාකාලය ඉක්මවා සපුරා ඇති මුළු සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සඳහා පහත ආකාරයට ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>[ ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණ / අයදුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන් අතරින් වැඩිම අමතර සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාගේ එකී සේවා කාලය (අවුරුදු ගණන X 12 + මාස) ] X [ අදාළ නිලධාරියාගේ අමතර සක්‍රිය හා සතුටුදායක සේවා කාලය (අවුරුදු ගණන X 12 + මාස) ] |
| 02 | කුසලතාවය (උපරිම ලකුණු 60) | **2:1 කාර්ය සාධන ඇගයුම් (පූර්වාසන්න වසර 05 හි) - උපරිම ලකුණු 05**<br>• විශිෂ්ඨ - ලකුණු 01<br>• සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - ලකුණු 0.75<br>• සතුටුදායක - ලකුණු 0.5<br><br>**2.2 ක්ෂේත්‍රයේ උන්නතියට අදාළ ඉදිරිපත් කිරීම - උපරිම ලකුණු 15**<br>• ඉදිරිපත් කරන කරුණු -ලකුණු 07<br>• සැකසුම, නිර්මාණය, ඉදිරිපත් කිරීමේ විලාශය හා කාල කළමනාකරණය -ලකුණු 04<br>• පරීක්ෂණ මණ්ඩලය යොමු කරන ගැටළු සඳහා දක්වන ප්‍රතිචාරය -ලකුණු 04<br><br>**2.3 තනතුරට අදාළව පශු සම්පත් ක්ෂේත්‍රයේ උන්නතියට දක්වන ලද දායකත්වය හා අදාළ ක්ෂේත්‍රයේ අත්දැකීම් - උපරිම ලකුණු 15**<br>• පශු සම්පත් ක්ෂේත්‍රයට ලබාදී ඇති දායකත්වය -ලකුණු 10<br>(එක් කාර්යයක් සඳහා ලකුණු 02 බැගින් හිමි වේ. ආයතන ප්‍රධානියා මඟින් ලිඛිතව සනාථ කළ යුතුයි.)<br>• අදාළ ක්ෂේත්‍රයේ අත්දැකීම් -ලකුණු 05<br><br>(සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් යොමුකරන ගැටළුවලට ලබාදෙන පිළිතුරු සම්බන්ධව සෑහීමකට පත්වීමෙන් පසු, එම මණ්ඩලය විසින් නිලධාරියාට ඉහත අනු සංරචක දෙක සඳහා ලකුණු ප්‍රදානය කරනු ලැබේ.)<br><br>**2.4 තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අධ්‍යාපන සුදුසුකම් - උපරිම ලකුණු 05**<br>**(අ). අධ්‍යක්ෂ තනතුරුවලට හා ලේඛකාධිකාරී තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අධ්‍යාපන සුදුසුකම් - උපරිම ලකුණු 05**<br>• පශ්චාත් උපාධිය හෝ ඊට සමාන හෝ ඉහළ සුදුසුකම් - ලකුණු 05<br>• පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 03 |

(ආ). ප්‍රධාන වසංගතවේදී, ප්‍රධාන ශෂ්‍යවේදී, ප්‍රධාන විද්‍යාඥ, ප්‍රධාන පශු ආර්ථික විශේෂඥ, පශු ව්‍යාප්ති විශේෂඥ, සත්ත්ව අභිජනන විශේෂඥ, පශු මහජන සෞඛ්‍ය විශේෂඥ, ක්ෂිර ඉංජිනේරු විශේෂඥ තනතුරුවලට අදාළ ක්ෂේත්‍රයේ අධ්‍යාපන සුදුසුකම් - උපරිම ලකුණු 05

- ආචාර්ය උපාධිය (Ph.D) - ලකුණු 05
- පශ්චාත් උපාධිය (M.Phi/Msc.By Research) - ලකුණු 03
- පශ්චාත් උපාධි (MSc.) - ලකුණු 02
- පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 01

**2.5 වෙනත් සුදුසුකම් - උපරිම ලකුණු 15**

- ජාත්‍යන්තර වශයෙන් ලබාගෙන ඇති සුවිශේෂී ජයග්‍රහණ සඳහා - ලකුණු 05 බැගින්
- ජාතික මට්ටමින් ලබාගෙන ඇති සුවිශේෂී ජයග්‍රහණ සඳහා - ලකුණු 04 බැගින්
- පළාත් මට්ටමින් ලබාගෙන ඇති සුවිශේෂී ජයග්‍රහණ සඳහා - ලකුණු 03 බැගින්
- ප්‍රශංසා සහතික (පොදු 230බී ආකෘතියෙන්) සඳහා - ලකුණු 02 බැගින්
- ජාත්‍යන්තර වැදගත්කමකින් යුතු ප්‍රකාශන සඳහා - ලකුණු 05 බැගින්
- ජාතික වැදගත්කමකින් යුතු ප්‍රකාශන සඳහා - ලකුණු 04 බැගින්
- ජාත්‍යන්තර විද්‍යාත්මක සඟරාවල පළ කරන ලද පත්‍රිකා සඳහා - ලකුණු 05 බැගින්
  - ✓ Full Paper in peer reviewed journals, Book Chapter - ලකුණු 05
  - ✓ Extended Abstract - ලකුණු 04
  - ✓ Abstract - ලකුණු 03
  - ✓ Newsletter/Leaflets - ලකුණු 02
- ජාතික විද්‍යාත්මක සඟරාවල පළ කරන ලද පත්‍රිකා සඳහා - ලකුණු 04 බැගින්
  - ✓ Full Paper in peer reviewed journals, Book Chapter - ලකුණු 04
  - ✓ Extended Abstract - ලකුණු 03
  - ✓ Abstract - ලකුණු 02
  - ✓ Newsletter/Leaflets - ලකුණු 01

(ඉහත එක් එක් අවස්ථා අතරින්, ආයතන ප්‍රධානියා විසින් සත්‍ය පිටපත් බවට සහතික කර ඇති, ලේඛන මඟින් සනාථ කෙරෙන උපරිම අවස්ථා පහක් (05) සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.)

**2.6 සම්මුඛ පරීක්ෂණයේදී දක්වන නිපුණතාවය - උපරිම ලකුණු 05**

පෙන්නුම් කරන ලද නායකත්ව කුසලතා සඳහා - ලකුණු 02
සන්නිවේදන කුසලතා සඳහා - ලකුණු 02
භාෂා හැකියාව සඳහා - ලකුණු 01

**මුළු ලකුණු : 100**

සැලකිය යුතුයි :

I. බඳවාගැනීමේ දී හෝ උසස් කිරීමකදී මූලික සුදුසුකමක් ලෙස සහ/ හෝ කාර්යක්ෂමතා කඩඉම් සඳහා සළකා නොබැලූ සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.

II. උසස් අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබාදීමේ දී ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.

III. පෞද්ගලික ලිපි ගොනුවේ ඇතුළත් පොදු 230බී ආකෘතියෙන් ලබාදෙන ලද ප්‍රශංසා සහතික සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.

07. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම් කිරීමට අපේක්ෂිත නිලධාරීන් මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රය සමඟ අනෙකුත් ලේඛනවල පිටපත් පරිදි තමා විසින්ම සහතික කරන ලද පිටපත් ඇතුළත් ගොනුවක් ද යොමු කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග
80/5, "ගොවිජන